සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක: 06 /2020

මගේ අංකය : PPSC/ES/12/FI/04/03/09
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය, රත්නපුර.
2020.02. 14

ප්‍රධාන ලේකම් ස.ප.ස.
ආණ්ඩුකාර ලේකම් ස.ප.ස.
ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය ස.ප.ස.
සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,රත්නපුර/කෑගල්ල
වෛද්‍ය අධිකාරී, දිස්ත්‍රික් මහ රෝහල - ඇඹිලිපිටිය
වෛද්‍ය අධිකාරී, මූලික රෝහල බලංගොඩ/කහවත්ත/මාවනැල්ල/කරවනැල්ල/වරකාපොල

**<u>අතුරු වෛද්‍ය සේවාවට අයත් පාසල් දන්ත චිකිත්සක පුහුණු පාසලට ආචාර්යවරුන් බඳවා ගැනීම.</u>**

රජයේ අමාත්‍යාංශය යටතේ පාලනය වන අතුරු වෛද්‍ය සේවාවට අයත් මහරගම මුඛ සෞඛ්‍ය ආයතනයේ පිහිටි පාසල් දන්ත චිකිත්සක පුහුණු පාසලේ ආචාර්ය තනතුරු වල පවතින පුරප්පාඩු පිරවීම සඳහා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් / ආයතනවල සේවයේ නියුතු සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/03/2019 හා 2019.11.26 දිනැති ලිපි මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි පළාත් සභා යටතේ පාලනය වන සෞඛ්‍ය ආයතන වල සේවය කරන එම තනතුරට අයත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව පිළියෙල කරගත් අයදුම්පත් රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යැවීම පිණිස ආයතන ප්‍රධානීන් මඟින් 2020.02.29 දිනට පෙර මා වෙත යොමු කිරීමට සැලැස්විය යුතුය.

01. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

I. අදාල තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරියෙකු වීම
II. අදාල තනතුරේ II ශ්‍රේණියට / II අ ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධරයෙකු වීම.
III. අයදුම්පත් කැඳවන දිනට අඛණ්ඩ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම,

02. වයස් සීමාව

බඳවා ගැනීම සිදු කරනුයේ අතුරු වෛද්‍ය සේවයට අයත් තනතුරු වල දැනටමත් සේවයේ නියුක්ත නිලධාරීන් අතුරින් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

03. වැටුප් පරිමාණය

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුකූලව සේවා ගණයට අදාල වැටුප් කේත අංකය MT 06 – 2016 හා වැටුප් පරිමාණය රුපියල් 32,080-445*10-660*11-730*10-750*10-58,590/- ක් වේ. එහි I ශ්‍රේණියට හිමි වැටුප් තලය හිමිවන අතර වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව සිදුකරනු ලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය

සුදුසුකම්ලත් අයදුම්කරුවන් අංක 05 හි දැක්වෙන ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගත් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ.

05. ලකුණු දීමේ ක්‍රමය

I. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමය

| | |
|---|---|
| අමතර සේවා පලපුරුද්ද | ( උපරිම ලකුණු 40) |
| ඉගැන්වීමේ පලපුරුද්ද | ( උපරිම ලකුණු 10) |
| අමතර අධ්‍යාපන සුදුසකම් | ( උපරිම ලකුණු 20) |
| විශේෂ කුසලතාවයන් | ( උපරිම ලකුණු 10) |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | ( උපරිම ලකුණු 15) |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | ( උපරිම ලකුණු 05) |
| | ( මුළු ලකුණු 100) |

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ විස්තරාත්මක ලකුණු පරිපාටිය ඇමුණුම් I මඟින් දක්වා ඇත.

II. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමය

| | |
|---|---|
| අරමුණු හා ප්‍රවිශ්‍යවීම | ( උපරිම ලකුණු 05) |
| පෞර්ෂය හා හඬ පාලනය | ( උපරිම ලකුණු 05) |
| සන්නිවේදනයේ පැහැදිලි බව | ( උපරිම ලකුණු 05) |
| කාල කළමනාකරණය | ( උපරිම ලකුණු 05) |
| ඉදිරිපත්කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | ( උපරිම ලකුණු 05) |
| | ( මුළු ලකුණු 25) |

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් ආචාර්ය තනතුර සඳහා පත්කරනු ලැබේ.

07. සේවා කොන්දේසි

I. මෙම තනතුර ස්ථිර වන අතර එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

08. සේවා වරප්‍රසාද

I. ආචාර්ය තනතුර I ශ්‍රේණියට අයත් ස්ථිර තනතුරක් වේ.

II. 2018.12.17 දිනැති 01-03/2019 අංක දරන පොදු චක්‍රලේඛය අනුව මෙම තනතුර සඳහා 2019.01.01 දින සිට රු.15000/- දක්වාත් 2020.01.01 දින සිට මාසිකව රු. 20000/- ක ඉගැන්වීමේ දීමනාවක් හිමිවේ.

III. පුහුණු පාසලක් සඳහා අනුමත ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරේ පුරප්පාඩුවකක් ඇති වුවහොත් ආචාර්ය තනතුරු වල වසර 05ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට එම තනතුර සඳහා අයදුම් කළ හැකි අතර විදුහල්පති තනතුරේ පුරප්පාඩුවක් ඇති වුවහොත් අදාල සුදුසකම් සපුරා ඇති ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ට එම තනතුර සඳහා අයදුම් කිරීමටද හැකියාව ඇත.

09. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. දැනට වැඩ බලන හෝ රාජකාරී ආවරණ හෝ අර්ධකාලීන පදනමින් හෝ ආචාර්ය තනතුරේ සේවය කරන නිලධාරීන් ස්ථිර පත්වීමක් අපේක්ෂා කරන්නේ නම් එම නිලධාරීන්ද අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

11. අතුරු වෛද්‍ය සේවාවට අයත් පුහුණු පාසල් වල ආචාර්යවරුන් බඳවාගැනීම් සම්බන්ධයෙන් වන මෙම චක්‍රලේඛය මගින් ආවරණය වන / නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් උද්ගත වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණයවේ.

12. සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක 02-04/2020 පොදු චක්‍රලේඛය හා මෙම චක්‍රලේඛය අතර යම් පරස්පරතාවක් ඇති බව පෙනී යන්නේ නම් එහිදී සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක 02-04/2020 පොදු චක්‍රලේඛය බලපැවැත්වේ.

පී.එස්.ආර්.එම්.විජයරාජ O/C
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඇමුණුම - I

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමය

1) අමතර සේවා පළපුරුද්ද

1.1. පුහුණු කිරීම්වලට අදාල සේවා පළපුරුද්ද

පුහුණු පාසලේ පරිපාලන කටයුතු වලට සහභාගී වීම - ලකුණු 12
ඉගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම - ලකුණු 04
අදාල ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන්වලට සහභාගී වීම - ලකුණු 04
(උපරිම ලකුණු 20)

1.2. ජ්‍යෙෂ්ඨතාවය

II අ ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දින සිට II ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 1½ බැගින්
I ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 2½ බැගින්
(අවම කාලය මාස 06ක් ඉක්ම වූ විට වසරකට හිමිවන ලකුණු වලින් අඩක් බැගින් ලබාදෙනු ලැබේ)
(උපරිම ලකුණු 20)

2) ඉගැන්වීමේ පළපුරුද්ද

සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක පූර්ණකාලීනව ඉගැන්වීම සිදුකල අවස්ථාවකදී එක් වසරකට ලකුණු 01 බැගින්
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක බාහිර දේශකයෙකු වශයෙන් ඉගැන්වීම් සිදුකල අවස්ථාවකදී එක් වසරකට ලකුණු 0.5 බැගින්.
(අවම කාලය මාස 06 ක් ඉක්මවූ විට වසරකට හිමිවන ලකුණු වලින් අඩක් බැගින් ලබාදෙනු ලැබේ.
(උපරිම ලකුණු 10)

3) අමතර අධ්‍යාපන සුදුසුකම්

විෂයට අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 20
විෂයට අදාල ක්ෂේත්‍රයේ I පන්තියේ උපාධිය සඳහා - ලකුණු 15
විෂයට අදාල ක්ෂේත්‍රයේ II පන්තියේ ඉහළ උපාධිය සඳහා - ලකුණු 12
විෂයට අදාල ක්ෂේත්‍රයේ II පන්තියේ පහළ උපාධිය සඳහා - ලකුණු 10
විෂයට අදාල ක්ෂේත්‍රයේ සාමාන්‍ය උපාධිය සඳහා - ලකුණු 08
විෂයට සෘජුවම අදාල නොවුවද විද්‍යාවේදී වැනි අදාල ඒකක සහිත උපාධියක් සඳහා ඉහත නිර්ණායක යටතේ හිමිවන ලකුණු වලින් අඩක් බැගින් ලකුණු හිමිවේ.
(ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දේ.) (උපරිම ලකුණු 20)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා/ වෙනත් අදාල ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 10

4) විශේෂ කුසලතාවයන්

අදාල වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රකාශයට පත්කර ඇති විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන පොත්පත් පුවත්පත්වල ප්‍රකාශිත ලිපි උපදෙස් හා මග පෙන්වීම්
විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන 01ක් සඳහා - ලකුණු 05
පොත්පත් සඳහා - ලකුණු 03
පුවත්පත්වල ප්‍රකාශන සියල්ලටම උපදෙස් හා මගපෙන්වීම් - ලකුණු 02
(03ට වඩා වැඩියෙන් තිබෙනම්) (උපරිම ලකුණු 10)

5) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය

ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රථම උපාධිය / පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා සමත්ව තිබීම - ලකුණු 15
පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු ඉංග්‍රීසි ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් - ලකුණු 15
අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා - ලකුණු 10
අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 08
(ඉහළම සුදුසුකමට ලකුණු ලබාදේ) (උපරිම ලකුණු 15)

6) සම්මුඛ පරීක්ෂණ කුසලතාව සඳහා (උපරිම ලකුණු 05)

මුළු ලකුණු 100

1.1 පුහුණුකිරීම්වලට අදාල සේවා පලපුරුද්ද සඳහා ලබාදෙන ලකුණු පහත පරිදි තවදුරටත් විස්තරාත්මකව

1. අමතර සේවා පළපුරුද්ද

1.1. පුහුණු කිරීම්වලට අදාල සේවා පළපුරුද්ද

1.1.1. පුහුණු පාසලේ පරිපාලන කටයුතුවලට සහභාගී වීම - ලකුණු 12

| | |
|---|---|
| විෂයමාලා සංවර්ධන කමිටු සාමාජික | - ලකුණු 2 බැගින් |
| සම්මත ක්‍රියා පිළිවෙත් (standard operating procedures ) සම්පාදන කමිටු සාමාජික | - ලකුණු 2 බැගින් |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද විභාග කමිටු සාමාජික | - එක් කමිටුවක් සඳහා ලකුණු 1 බැගින් |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද විභාග ප්‍රතිඵල කමිටු සාමාජික | - එක් කමිටුවක් සඳහා ලකුණු 1 බැගින් |
| විභාග පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම (ප්‍රශ්න පත්‍ර සැකසීම) | - එක් විභාගයක් සඳහා ලකුණු 0.5 බැගින් |
| විභාග පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම (ප්‍රායෝගික හෝ වාචික) | - එක් විභාගයක් සඳහා ලකුණු 0.5 බැගින් |
| කාර්යක්ෂමතා කඩඉම් විභාගයක විභාග පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම | - එක් විභාගයක් සඳහා ලකුණු 0.5 බැගින් |

1.1.2. ඉගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන්වලටසහභාගී වීම - ලකුණු 04

අධ්‍යාපන පුහුණු හෝ පර්යේෂණ ඒකකය හෝ උසස් අධ්‍යාපන අමාත්‍යංශය අනුමත කල ආයතනයක් මගින් සිදුකරන ලද පුහුණු වැඩසටහනකට සහභාගීවීම - එක් සතියකට ලකුණු 02 බැගින්

වෙනත් පුහුණු ආයතනයක් මගින් සිදුකරන ලද දින 05 කට නොඅඩු පුහුණු වැඩසටහනකට සහභාගී වීම - එක් සතියකට ලකුණු 0.5 බැගින්

1.1.3. අදාල ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්වලට සහභාගීවීම - ලකුණු 04

| | |
|---|---|
| සමායෝජක හෝ සංවිධායක ලෙස | - පුහුණු වැඩසටහනකට ලකුණු 02 බැගින් |
| සම්පත් දායකයෙකු ලෙස හෝ දේශකයෙකු ලෙස | - පුහුණු වැඩසටහනකට ලකුණු 01 බැගින් |

## ආදර්ශ අයදුම්පත

## අභ්‍යන්තර වෛද්‍ය සේවාවට අයත් පාසල් දන්ත චිකිත්සක පුහුණු පාසලට ආචාර්යවරුන් බඳවා ගැනීම

I කොටස ; අදාළ නිලධාරිණිය / නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. (අ) නිලධාරිණිය / නිලධාරියාගේ මුලකුරු සමඟ නම :-

......................................................................................................................

(ආ) සම්පූර්ණ නම :-

......................................................................................................................

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :- ....................................................

(ඈ) දුරකතන අංක :- ජංගම :- ....................................................

ස්ථාවර :- ....................................................

2. සේවා ස්ථානය:-......................................................................................................

3. පුහුණුවට බැඳුණු දිනය:-..........................................................................................

4. II "ආ" ශ්‍රේණියේ තනතුරට පත්වීම් ලද දිනය:- ...........................................................

5. (අ) II "අ" ශ්‍රේණියට උසස් වූ දිනය:-..........................................................................

(ආ) II "අ" ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය/ දිනයන්:-

......................................................................................................................

(ඇ) වර්තමාන ශ්‍රේණිය හා එම ශ්‍රේණියට උසස් වූ දිනය:-..................................................

6. (අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර (05) ක් තුළ සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද?:- ...........................................................................

I. 2014 ......................................................................................................

II. 2015 ......................................................................................................

III. 2016 ......................................................................................................

IV. 2017 ......................................................................................................

V. 2018 ......................................................................................................

VI. 2019 ......................................................................................................

(ආ) උපයාගෙන නොමැති නම් ඊට හේතු:-

......................................................................................................................

......................................................................................................................

7. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) ක සේවා කාලය තුළ, ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර

(අ) වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබා තිබේ නම් අදාල කාලවකවානු

..........................................................................................................................................

..........................................................................................................................................

(ආ) වෙනත් වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් අදාල කාලවකවානු හා හේතු,

..........................................................................................................................................

8. (අ) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද? ..........................................................................................

(ආ) තිබේනම් ඒ පිළිබඳ විස්තර :- ..............................................................................................

..........................................................................................................................................

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි සඳහන් විස්තර කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගනු ලැබීමට පෙර සොයා ගතහොත් එයින් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසුව සොයා ගතහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

..........................................                ..........................................

දිනය                 අයදුම්කරුගේ අත්සන

2 කොටස: ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය.

මාගේ අධීක්ෂණය යටතේ පාසල් දන්ත චිකිත්සක තනතුරේ සේවය කරන ..........................................................................................................................නිලධාරිනිය අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේ නම් පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරක් සඳහා පත් කිරීම නිර්දේශ කරමි.

..........................................                ..........................................

දිනය                විශේෂ ශ්‍රේණියේ නිලධාරියාගේ/ අංශ ප්‍රධානියාගේ නිල මුද්‍රාව හා අත්සන

3 කොටස: විෂය භාර නිලධාරියා/නිලධාරිණිය විසින් අදාල නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

අදාල නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සට 8 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

.................................... ....................................................................

දිනය

විෂය භාර නිලධාරියාගේ/නිලධාරිනියගේ අත්සන

4 කොටස: පරිපාලන නිලධාරියාගේ/නිලධාරිනියගේ නිර්දේශය

අදාල නිලධාරියාගේ අයදුම්පතේ 1 සිට 9 දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව සහතික කරමි. අයදුම්පත්‍රය නිර්දේශ කරමි.

.................................... ....................................

දිනය

පරිපාලන නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

5 කොටස: ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-

පාසල් දන්ත චිකිත්සක තනතුර දරණ .............................................................................................. මියා/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය එම තනතුරේ II ශ්‍රේණියට ...................... දිනට උසස්වීම ලබා ඇති බවත්, ................................................ දින II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි. අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුර වන මෙම අයදුම්පත නිර්දේශ කරමි.

............................................ ..........................................

දිනය

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

➢ පළාත් සභා යටතේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා සම්පූර්ණ කළ යුතුයි

6. කොටස: ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශය:-

ශ්‍රේෂ්ඨය අමාත්‍යාංශය යටතේ වන පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද පළාත් සභා යටතේ සේවය කරන පාසල් දන්ත චිකිත්සක නිලධාරීන්ගෙන් සේවාවන් ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/03/2019 හා 2019.11.26 දිනැති ලිපි මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි, සකස් කරන ලද ........... දිනැති පොදු චක්‍රලේඛය ...........................ට අනුව පාසල් දන්ත චිකිත්සක තනතුර දරණ .......................................................................................................... මිය/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය එම තනතුරේ II ශ්‍රේණියට .................................. දිනට උසස්වීම් ලබා ඇති බවත්, ............................................ දින II කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි. අනුරූ වෛද්‍ය සේවාවට අයත් පාසල් දන්ත චිකිත්සක තනතුර සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පත නිර්දේශ කරමි.

...........................................

දිනය

...........................................

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව

7. කොටස: පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශය:-

ශ්‍රේෂ්ඨය අමාත්‍යාංශය යටතේ වන පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද පළාත් සභා යටතේ සේවය කරන පාසල් දන්ත චිකිත්සක නිලධාරීන්ගෙන් සේවාවන් ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/03/2019 හා 2019.11.26 දිනැති ලිපි මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි, සකස් කරන ලද ........... දිනැති පොදු චක්‍රලේඛය ...........................ට අනුව පාසල් දන්ත චිකිත්සක තනතුර දරණ .......................................................................................................... මිය/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය එම තනතුරේ II ශ්‍රේණියට .................................. දිනට උසස්වීම් ලබා ඇති බවත්, ............................................ දින II කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි. අනුරූ වෛද්‍ය සේවාවට අයත් පාසල් දන්ත චිකිත්සක තනතුර සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පත නිර්දේශ කරමි.

...........................................

දිනය

...........................................

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව

8. කොටස: පළාත් සෞඛ්‍ය ලේකම්ගේ නිර්දේශය:-

රේඛීය අමාත්‍යාංශය යටතේ වන පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද පළාත් සභා යටතේ සේවය කරන පාසල් දන්ත චිකිත්සක නිලධාරීන්ගෙන් සේවාවන් ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/03/2019 හා 2019.11.26 දිනැති ලිපි මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි සකස් කරන ලද .......... දිනැති පොදු චක්‍රලේඛ ..........ට අනුව පාසල් දන්ත චිකිත්සක තනතුර දරණ .......... මිය/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය එම තනතුරේ II ශ්‍රේණියට .......... දිනට උසස්වීම් ලබා ඇති බවත්, .......... දින II කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි. අතුරු වෛද්‍ය සේවාවට අයත් පාසල් දන්ත චිකිත්සක තනතුර සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පත නිර්දේශ කරමි.

..........................................

දිනය

..........................................

පළාත් සෞඛ්‍ය ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව

9. කොටස: පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශය:-

රේඛීය අමාත්‍යාංශය යටතේ වන පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද පළාත් සභා යටතේ සේවය කරන පාසල් දන්ත චිකිත්සක නිලධාරීන්ගෙන් සේවාවන් ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-05/03/2019 හා 2019.11.26 දිනැති ලිපි මඟින් ලැබී ඇති අනුමැතිය පරිදි, සකස් කරන ලද .......... දිනැති පොදු චක්‍රලේඛය ..........ට අනුව පාසල් දන්ත චිකිත්සක තනතුර දරණ .......... මිය/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය එම තනතුරේ II ශ්‍රේණියට .......... දිනට උසස්වීම් ලබා ඇති බවත්, .......... දින II කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති බවත් සහතික කරමි. .......... මිය/මෙය රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින පාසල් දන්ත චිකිත්සක පුහුණු පාසලේ පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුරට පත්වීමට සුදුසුකම් ලැබුවහොත්, ඇය රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැරීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය පළකරන අතර, ඇය විසින් ඉදිරිපත් කරන ලද අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක ආචාර්ය තනතුර සඳහා වන මෙම අයදුම්පත නිර්දේශ කරමි.

..........................................

දිනය

..........................................

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව